

# හොඳ ගීතයක් නම්

**මහින්ද දිසානායක දිවුල්ගනේ**

සංගීතය හා පද්‍ය කාව්‍ය යන අංශ දෙකේ අනුරූපතාවන්ගෙන් හා සම්මිශ්‍රණයෙන් බිහිවන කලාංගයක් සේ ගීතය හැඳින්වීම යුක්ති සහගත වේ. කවියේ පිරිහීමට ගීතය ප්‍රබල ලෙස බලපා ඇති බවක්ද විචාරකයන්ගේ මතය වුවද සාහිත්‍යාංගයක් ලෙස ගීතය යුගානුරූපව වෙනස් වෙමින් ජනතාවට ඉතා සමීපතම බවට පත්ව තිබීම නොවැලැක්විය හැක්කක් වේ. කෙසේ වුවද ගීතය එයටම ආවේනික වූ ගතිලක්ෂණ හා සීමාවලින් සමන්විත වූ ස්වාධීන සුභාෂිත කලා මාධ්‍යයක් ලෙස හැඳින්විය හැකිය. එහෙත් කලාත්මක ගීතයක ලක්ෂණ හා සීමාවන් හඳුනාගත් ගීත රචකයන්ද ඇත්තේ විරල වශයෙනි.

මිනිස් සංතානයේ හටගත් අනේකවිධ වූ, සෞන්දර්යාත්මක වූ සිතුම් පැතුම් සටහන් කර ගීතයක් ලිවීමට ඕනෑම කෙනෙකුට සමහර විට හැකිය. එහෙත් එය අර්ථවත් සාහිත්‍ය ගුණයෙන් හෙබි හොඳ ගීතයක් නොවිය හැකිය. මුලින්ම හොඳ ගීතයක් වීමට, එය ජනතාවගේ හෘද කම්පනයට සමත් වූ ගීතයක් බවට පත්වීමට කරුණු රාශියක් සමන්විත විය යුතුය. මුලින් ම ගීපද රචනයත් තනු නිර්මාණය හා සංගීතයත් ස්වර අනුව ගායනා කිරීමත් එසේත් නොමැති නම් හොඳට ගායනා කිරීමත් යන මේ ත්‍රිවිධ ඒකාත්මික බව හොඳ ගීතයක දැකිය හැකි ප්‍රධානතම ලක්ෂණය වේ.

මා මුලින් ප්‍රකාශිත කරුණු අනුව ඕනෑම අයෙකුට කවියක් හෝ ගීතයක් ලිවීමේ හැකියාව තිබිය හැකිය. එහෙත් සාහිත්‍ය ගුණයෙන් අනූන එම රසයෙන් හෙබි ගීතයක් ලිවීම උගහට වේ. මේ සඳහා ඔහුට හොඳ වාසනා ගුණයක් උපතින්ම තිබියයුතු වීම විශේෂයකි. රචකයා සාහිත්‍ය, භාෂාව සමාජ සංස්කෘතික සම්බන්ධතා හා අපේ අනන්‍යතාවය හොඳින් ප්‍රගුණ කළ අයෙක් වීම මෙහිදී වැදගත් වේ. නිරන්තර අභ්‍යාසයද මේ සඳහා අත්වැලක් වේ. ඔහු සමාජයෙන් ලද අත්දැකීමක් හෝ අසා දැනගත් දෙයක් ද විය හැකිය. එසේ නොමැති නම් තමාම අත්විඳ අත්දැකීමක්ද මේ සඳහා සම්බන්ධ වේ. එම අත්දැකීම පොදු අත්දැකීමක් බවට පත් කිරීමට රචකයා ඉතා කල්පනාකාරී ලෙස භාෂාවෙහි වචන ඒ සඳහා යොදා ගනී. ඔහු ලැබූ විශාලතම වූ අත්දැකීම වචන කීපයක් මගින් හා උපමා අලංකාර සංකේත භාවිතා කර එය සාහිත්‍යමය ගුණයෙන් අනූන වූ රචනයක් බවට පත්කරයි.

රචකයා ලැබූ අත්දැකීම ඔහු තම වචන මඟින් පොදු අත්දැකීමක් බවට පත් කරයි. සහෘද ජනතාව එය ආදරයෙන් වැළඳගත්තේ ඔහුගේ හදවතට සමීප වී, කම්පනය වී, ඔවුන්ගේද අත්දැකීමක් බවට එය පත් වූ විටදීය. මුලින්ම ගීත රචකයා එම අත්දැකීමෙන් ඔහු කම්පනයට පත්විය යුතුය. එම අත්දැකීමට ආවේශ විය යුතුය.

ගීත රචනයේදී විශේෂයෙන් හැම නිර්මාණයකදීම දැකිය හැකි වූ ආදරය ගැන වුවද එයම නොකියා අළුත් පැතිකඩකින් එම පොදු මාතෘකාව දෙස බැලිය හැකි වීමේ දක්ෂතාවයක් තිබීම වැදගත් වේ. මේ සඳහා අපේ ගීත ඉතිහාසයෙන් ඕනෑතරම් ගීත උදාහරණ සේ ගත හැකිය. කලා කරුවා වනාහි සාමාන්‍ය ජනතාවගෙන් වෙනස් වන්නේ ඔහු යමක් දෙස විනිවිදව දැකීමේ හා සාමාන්‍ය මිනිසුන් යමක් දෙස නොපෙනෙන පැත්තක් ඔහුට දැකීමේ වරප්‍රසාදය ඇති බැවිනි.

හොඳ ගීතයක් තුල හොඳ පදමාලාවක් තිබිය යුතුය. ආදරය ගත්විට එයද විවිධාකාරය. දෙමාපියන්, දරුවන්, බිරිඳ හා තම ආදරවන්තිය යන මේ විවිධ වූ පුද්ගලයන්ට දක්වන සෙනෙහස එකක්ම නොවේ. මේ හැම අංශයක් ගැනම ගීත ලියවී ඇත. එමෙන්ම ඊට වෙනස් වූ පරිසරය, ජාතිකාභිමානය, බොදුබැති වැනි මාතෘකා යටතේ ලියවුන ගීත එදා පමණක් නොව අදද ජනතාවගේ සිත් සතන් තුල නොමැකෙන සේ සනිටුහන් වී තිබේ. එසේ නොමැතිව ජනප්‍රියවීම සඳහා ආදරයට මාතෘකා නොවිය යුතුවේ. පණ්ඩිත් අමරදේවයන් ගායනා කරණ 'සන්නාලියනේ' ගීතය ජීවිතයේ ආරම්භයත් විවාහ ජීවිතයත් මරණයත් යන අවස්ථා නිරූපනය කරමින් ඉදිරිපත් වූ විවරණයක් වුවද මිනිසුන් අතර අතිශය ජනප්‍රිය වේ. ''ඉරට මුවාවෙන් " ගීතයද එසේමය. එපමණක් නොව ඒ සඳහා උදාහරණ විශාල ප්‍රමාණයක් ගීත ඉතිහාසයෙන් ලබා දීමට හැකිය. හැම විටම විය යුත්තේ නවතම නිර්මාණයක් ශ්‍රාවක ජනතාවට ප්‍රධානය කිරීමයි. එය කිනම් හෝ මාතෘකාවක් යටතේ ලියවුනද නම්‍ය බව එතුල සුරැකිය යුතුය.

ගීත රචනය පමණක් නොවේ. සංගීතයද ගීතයක් සඳහා අතිශයින්ම වැදගත් වේ. හින්දි ගීත බොහෝ දෙනෙක් ප්‍රියකරන්නේ එහි අර්ථය සලකා නොවේ. සංගීතයෙහි ඇති මාධූර්ය ශ්‍රවනය නිසාවෙනි. ගීතයක් සඳහා සංගීත නිර්මාණය මේ නිසා විශේෂයෙන් වැදගත් වේ. ගීත රචකයා විසින් ලියන ලද ගීතය සංගීතයෙන්ද අත්දැකීමක් විය යුතු සේම ඔහුද එය පොදු අත්දැකීමක් බවට පත් කිරීමට උචිත සේ සංගීතය සංයෝජනය කළයුතු වේ. එම ගීතයෙන් කියවෙන අර්ථය මෙන්ම පරිසරය අනුව සංගීත භාණ්ඩ තෝරා ගැනීමටද සංගීත නිර්මාණය කරන්නාට සිදුවේ. උදාහරණයක් ලෙස ගැමිකම නිරූපණය කරන බටනලාවක් දුකක් තීව්‍රකිරීමට වයලීනයක් දැකිවිය හැකිය. විටෙක ගීතය සාර්ථකත්වයට සංගීතය මූලික වන බවක්ද සිතිය හැකිය.

ගීතයන සාර්ථකත්වයට සංගීතය පද රචනය මෙන්ම ගායන හැකියාවද විශේෂයෙන් වැදගත් වේ. ගීතයෙහි අර්ථයට පිවිසීමත් ස්වර අනුව පිහිටා තම ආවේනික හඬකින් ගායනා කිරීමද සහෘද ජනතාව අතර ජනප්‍රියත්වයට මෙන් ම ඔවුනට නවමු අත්දැකීමක් ස්පර්ෂ කිරීමට මේ තුලින් හැකිවේ.


